# බහුවිධ බුද්ධිය

## භාෂාමය බුද්ධිය

භාෂාමය බුද්ධිය (word smart) යනු ඔබේ මව් භාෂාව සහ වෙනත් භාෂා භාවිත කිරීම මගින් මනසෙහි ඇති දේ ප්‍රකාශ කිරීමට සහ වෙනත් පුද්ගලයන් තේරුම් ගැනීමට ඇති හැකියාවයි.

එනම් කාර්යක්ෂම ලෙස වචන භාවිතයේ ඇති හැකියාව, භාෂාව හැසිරවීම සහ රචනය, විවාද කිරීම හා හාස්‍යය තුළින් භාෂාවේ අරුත් දැක්වීම ආදි.

ඉහළ භාෂාමය බුද්ධියක් ඇති අය කියවීමට, ලිවීමට, කතන්දර කීමට, දින වකවානු සමඟ වචන කටපාඩම් කිරීමට දක්ෂය.

භාෂා බුද්ධිමතුන් හොඳින් ඉගෙන ගන්නේ,

- පොත් වාර්තාකරණයෙන්
- විහිළු කතා කිමෙන්
- වචන ලිවිමෙන්
- කියවිමෙන්
- සඟරා ලිපි ලිවිමෙන්
- කතන්දර කිමෙන්
- සාකච්ඡා කිරිමෙන්
- නිර්මාණාත්මක ලිවීමෙන්
- විවාද කිරීමෙන්
- යමක් ඒත්තු ගැන්වීමෙන්

**රැකියා/ වෘත්ති**

- ලේඛක
- මාධ්‍යවේදී
- කවියා
- ගුරු
- ගුවන්විදුලි නිවේදක
- පරිවර්තක
- නිතිඥ
- දාර්ශනික
- දේශපාලනඥ
- කථිකයා
- රංගන ශිල්පී

## දෘශ්‍ය - අවකාශිය බුද්ධිය

දෘශ්‍ය අවකාශිය බුද්ධිය (Picture smart) යනු රූප සහ පින්තූර මගින් සිතීමටත්, නිවැරදිව හා වියුක්ත ලෙස දෘශ්‍යමාන කිරීමට ඇති හැකියාවයි.

එනම් දෘශ්‍ය හා අවකාශ ලෝකය නිරවද්‍ය ලෙස සංජානනය කිරීමේ හැකියාව සහ සිතියම් ගොඩනැගිම හා දෘශ්‍ය කලා නිර්මාණය මගින් මානසික පරිකල්පන ගොඩනැගීමේ හැකියාවයි.

ඉහළ දෘශ්‍ය අවකාශිය බුද්ධියක් ඇති පුද්ගලයන්ට මනසෙන් දෘශ්‍යමාන කිරීමේ හැකියාව ඇත.

දෘශ්‍ය අවකාශිය බුද්ධිමතුන් හොඳින් ඉගෙන ගන්නේ,

- අත් පත්‍රිකා මගින්
- කොලාජ් මගින්
- නිර්මාණ මගින්
- චිත්‍ර මගින්
- ප්‍රස්ථාර මගින්
- සිතියම්ගත කිරීමෙන්
- මැටි අච්චු මගින්
- රටා මගින්
- පින්තාරු කිරීමෙන්
- ඡයාරූප ශිල්පයෙන්
- පෝස්ටර් මගින්
- මූර්ති නිර්මාණයෙන්
- දෘශ්‍යමාන කිරීමෙන්
- අදහස් කටුසටහන් කිරීමෙන්
- යමක් ලේබල් කිරීමෙන්

### රැකියා/ වෘත්ති

- ප්‍රචාරණකරු
- ගෘහ නිර්මාණ ශිල්පි
- සිතියම්කරු
- කෙටුම්පත්කරු
- ඉංජිනේරු
- ලලිත කලාකරු
- ග්‍රැෆික් නිර්මාණකරු
- විලාසිතා නිර්මාණකරු
- අභ්‍යන්තර සැලසුම්කරු
- නව නිපයුම්කරු
- පින්තරුකරු
- ඡයාරූප ශිල්පි
- මූර්ති ශිල්පි
- මිනින්දෝරු
- නාගරික සැලසුම්කරු

## තාර්කික - ගණිතමය බුද්ධිය

තාර්කික ගණිතමය බුද්ධිය (Logical smart) යනු සංඛ්‍යා පලදායි ලෙස භාවිත කිරීමට සහ හොඳින් තර්ක කිරීමට ඇති හැකියාවයි.

මෙම බුද්ධිය ඇති පුද්ගලයන් තර්කානුකූලව සිතන අතර, ඔවුන් අත්හදා බැලීමට,ප්‍රශ්න කිරීමට, තාර්කික ප්‍රහේලිකා හඳුනා ගැනීමට සහ ගණනයට ප්‍රිය කරයි.

ගැටලුවක් හඳුනා ගෙන ඉක්මනින් එය විසඳා ගැනීමට ඔවුන්ට හැකියාව ඇත.

සංඛ්‍යා යෙදීමේ හැකියාව සහ විද්‍යාත්මක චින්තනය කාර්යක්ෂම ලෙස විශ්ලේෂණය කිරිමේ හැකියාව, උද්ගාමී හා නිගාමී චින්තනය.

ගණිතමය බුද්ධිමතුන් හොඳින් ඉගෙන ගන්නේ,

- විශ්ලේෂණය කිරීම මගින්
- වර්ගීකරණය මගින්
- ගණිත සූත්‍ර මගින්
- තාර්කික ක්‍රීඩා
- අංක මගින්
- දළ සටහන් මගින්
- රටා මගින්
- ගැටලු විසඳීම මගින්
- තර්ක කිරීම මගින්
- කාල රේඛා මගින්
- සංශ්ලේෂණය මගින්
- අනුපිළිවෙල මගින්
- තාර්කික චින්තනය මගින්
- වීද යාත්මක චින්තනය මගින්
- රූප සටහන් මගින්
- සංඛ්‍යා ලේඛන මගින්

### රැකියා/ වෘත්ති

- ගණකාධිකාරි
- ඉංජිනේරු
- වෛද්‍ය
- බැංකු කරු
- ව්‍යාපාරික
- පරිගණක විශ්ලේෂක
- පරිගණක වැඩසටහන්කරු
- විද්‍යා/ ගණිත ගුරු
- ආර්ථික විද්‍යාඥ
- නිතිවේදි
- ගණිතඥ

- සංඛ්‍යා ලේඛනකරු
- කාර්මිකකරු

## සංගිත බුද්ධිය

සංගිත බුද්ධිය (Musical Smart) යනු නාද සහ රිද්මය නිර්මාණ කිරීමට සහ අගය කිරීමට ඇති හැකියාවයි.

එනම් සංගිතමය රටා හදුනා ගැනීමට, සම්පාදනය කිරීමට හා පරිනාමනය කිරීමට ඇති හැකියාව

සංගීතමය වශයෙන් බුද්ධිමත් පුද්ගලයන්ට අවට ඇති ශබ්ද වෙන්කර හඳුනාගත හැකි අතර ඔවුන්ගේම තනු නිර්මාණය කළ හැකිය.

සංගිත බුද්ධිය සහිත පුද්ගලයන් හොඳින් ඉගෙන ගන්නේ,

- බැලඩ් ගායනා කිරීමෙන්
- ගිතිකා නිර්මාණය කිරිමෙන්
- ගීත නිර්මාණය කිරීමෙන්
- පාරිසරික ශබ්ද ශ්‍රවනය මගින්
- ශබ්ද සමග නිදර්ශනය කරීම මගින්
- රිද්මයන්
- උපකරණ ශබ්ද මගින්
- සවන්දීම මගින්
- ගී පද මගින්
- මනෝ සංගීතයමගින්
- සංගීත සංයුතිය හෝ නිර්මාණය මගින්
- සංගිත සංකල්ප මගින්
- බෙරවාදනය සහ රැප් මගින්
- ශබ්ද සහ රිද්ම ප්‍රතිනර්මාණය කිරීම මගින්
- ගායනය සහ ගීත මගින්

**රැකියා/ වෘත්ති**

- ගිත රචක
- ප්‍රසංග සංගිතඥ
- පියානෝ සුසර කරන්නා
- ගායක
- සංගිත රංග නළු/ නිළිය
- ස්ටුඩියෝ ඉංජිනේරු
- උපකරණ කලමනාකරු
- රැප් ගායක

- වෙළඳ දැන්වීම් නියෝජිත
- චිත්‍රපට/ උපකරණ සාදන්නා
- නිර්මාපකයන්
- සංගිත ගුරු
- ශබ්ද ඉංජිනේරු
- සංගීත චිකිත්සක

## කායික සංචලන බුද්ධිය

කායික සංචලන බුද්ධිය (Body smart) යනු යම් පුද්ගලයකු අදහස් සහ හැඟීම් ප්‍රකාශ කිරීමට සඳහා ශරිරය හැසිරවිමේ විශේෂඥතායකින් යුක්ත විමයි.

එය කෙනෙකුගේ ශරීර චලනයන් පාලනය කිරීමට සහ ශරීරය හැසිරවිම මගින් දක්ෂ ලෙස වස්තූන් හැසිරවිමට ඇති හැකියාවයි.

ඉහළ කායික චාලක බුද්ධියක් ඇති පුද්ගලයින්ට සම්පූර්ණ ශරිර පාලනය, වේලාව පිළිබඳ හැඟිම, භෞතික ක්‍රියාවක ඉලක්කය පිළිබඳ පැහැදීලි හැඟිමක් ඇත.

කායික සංචලන බුද්ධිය සහිත පුද්ගයන් හොඳින් ඉගෙන ගන්නේ,

- රඟපෑම මගින්
- නැටුම් මගින්
- දේවල් ගොඩනැගීම මගින්
- අත්හදා බැලිම් මගින්
- ක්ෂේත්‍ර චාරිකා මගින්
- ජිම්නාස්ටික් මගින්
- පුද්ගලාරෝපණය මගින්
- නව නිපැයුම් මගින්
- සටන් කලාව මගින්
- අංග චලනයෙන් රගපෑම මගින්
- රූකඩ කලාව මගින්
- සංචාරය කිරිම මගින්
- ක්‍රිඩා සහ ශාරිරික ක්‍රිඩා මගින්
- ස්පර්ශ කළ හැකි අත්දැකිම් මගින්
- ප්‍රායෝගිකය ඉගෙනීම මගින්

| රැකියා/ වෘත්ති |
|---|

- නළුවා
- මලල ක්‍රිඩක
- වඩු කාර්මික
- නර්තන ශිල්පි
- අත්‍යන්ත්‍ර ශිල්පි
- නර්තන ශිල්පී
- පොලිස් නිලධාරි
- ශෛල්‍ය වෛද්‍ය
- යාන්ත්‍රික ඉංජිනේරු
- ශාරිරික අධ්‍යාපන ගුරු
- භෞත චිකිත්සක
- සොල්දුවා
- වන සංරක්ෂන නිලධාරි

## අන්තර් පුද්ගල බුද්ධිය

අන්තර් පුද්ගල බුද්ධිය (People Smart) යනු අනෙක් පුද්ගලයන් තෙරුම් ගැනීමයි.

අනුන්ගේ චිත්ත ස්වභාව, හැඟිම් සහ පෙළඹවිම හඳුනා ගැනීමට ඇති හැකියාව සහ අන් අයගේ මනෝභාවයන් හැගිම් ස්වභාවයන් සහ අභිප්‍රේරණවලට සංවේදි විම. කණ්ඩායමක් තුළ සහයෝගයෙන් කටයුතු කිරීමේ හැකියාව අනුන් සමග සන්නිවේදනය කිරීමේ හැකියාවයි.

අන්තර්පුද්ගල බුද්ධිය සහිත පුද්ගලයන් හොඳින් ඉගෙන ගන්නේ,

- ගුරුවරයාට හෝ මිතුරන්ට ප්‍රතිපෝෂණ ලබා දිම මගින්
- අන් අයගේ හැගිම් තේරුම් ගැනිම මගින්
- පුද්ගල සන්නිවේදනය මගින්
- සමූහ ඉගෙනුම් උපාය මාර්ග මගින්
- ප්‍රතිපෝෂණ ලැබිම මගින්
- කණ්ඩායම් ව්‍යාපෘති මගින්
- යම් කෙනෙකුට අලුත් දෙයක් ඉගැන්විම මගින්
- වෙනත් දෘෂ්ටි කොණවලින් බැලීම මගින්
- කණ්ඩායම් අතර අනුගමනය කළ යුතු නිති රිති නිර්මාණය කිරීම මගන්
- නාට්‍යක හෝ අනුකරණයක රගපෑම මගින්
- සම්මුඛ පරික්ෂණ යක් පැවැත්වීම මගින්
- ගෙදර වැඩ සඳහා දුරකතන මිතුරුන් ඇති කර ගැනිම මගින්

- අන් අයගේ හැඟිම් දැනිම මගින්

**රැකියා/ වෘත්ති**

- පරිපාලක
- මානව විද්‍යාඥ
- උපදේශක
- කලමනාකරු
- හෙදි
- පිරිස් අධ්‍යක්ෂ
- දේශපාලඥ
- සමාජ සේවක
- මානව සම්බන්ධතා නිළධාරි
- විකුණුම්කරු
- විදුහල්පති
- සමාජ විද්‍යාඥ
- චිකිත්සක
- ගුරු
- සංචාරක නියෝජිත
- ආගමික නායක
- මනෝවිද්‍යාඥ

# අන්තඃපුද්ගල බුද්ධිය

අන්තඃපුද්ගල බුද්ධිය යනු ඔබ, ඔබ ගැන කොතරම් හොඳින් දන්නවාද යන්නයි.ස්වයං දැනුවත්වීමේ හැකියාව (Self Smart) සහ අභ්‍යන්තර හැඟිම්, සාර්ධර්ම, විශ්වාස සහ චින්තන ක්‍රියාවලි සමඟ ගැළපේ.
එනම් තමා ගැන දැන ගැනිමේ හැකියාව, තමාගේ චිත්ත ස්වභාව හැඟිම් හා පෙළඹවීම් හඳුනා ගැනීමේ හැකියාව ඒ අනුව ක්‍රියාකිරීමේ හැකියාවයි.

අන්තඃපුද්ගල බුද්ධිය සහිත පුද්ගලයන් හොඳින් ඉගෙන ගන්නේ,

- ස්වයං චරිතාපදානය මගන්
- පුද්ගලික හැඟීම් පිළිබඳ දැනුවත්භාවය මගින්
- හැඟීම් ප්‍රකාශ කිරිම මගින්
- අවධානය යොමු කිරිම මගින්
- නිදහස් තේරිම් මගින්
- ඉලක්ක සැකසීම මගින්
- උසස් මනසකින් යුතුව සිතිම හා තර්ක කිරීම මගින්
- ස්වාධින අධ්‍යන ව්‍යාපෘති මගින්
- මනොභාවය දැනුවත් කිරීම සහ මාරු වීම මගින්

- පුද්ගලික ප්‍රමුඛතා මගින්
- පුද්ගලික ප්‍රක්ෂේපණය මගින්
- ස්වයං හඳුනා ගැනීම මගින්
- චින්තන උපාය මාර්ග මගින්

## රැකියා/ වෘත්ති

- පූජක
- ව්‍යවසායක
- වැඩසටහන් සැලසුම්කරු
- මනෝචිකිත්සක
- දාර්ශනිකයා
- දේවධර්මාචාර්ය
- පර්යේෂක
- අධ්‍යාත්මික උපදේශක
- මනෝවිද්‍යාඥ